30-11-2023 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ආධ්‍යාත්මික මහ පෙන්වන්නන් බවට පත් වී මෙම වන්දනා ගමනේ ඉදිරියට ගොස් අන් අයව ද ඉදිරියට රැගෙන යා යුතුයි. මෙම ස්මරණය ඔබගේ වන්දනාවයි. දිගින් දිගටම මෙම ස්මරණය තබා ගනිමින් සිටින්න. එවිට ඔබගේ සතුටේ රසදිය කඳ ඉහළ නඟිනු ඇත.

**ප්‍රශ්නය:** අශරීරික ලෝකය වෙත ගිය සැනෙකින්ම ඔබ තුළින් අතුරුදන් වී යන සංස්කාර මොනවාද? ඔබ තුළ ඉතිරිවන සංස්කාර මොනවාද?

**පිළිතුර:** දැනුමේ සංස්කාර අතුරුදන් වී ප්‍රතිලාභයේ සංස්කාර පමණක් ඉතිරිවනු ඇත. සංගම යුගයේදි ඔබ ඔබගේ ප්‍රතිලාභය විඳින්නේ මෙම සංස්කාර මත පදනම්වයි. ඉගෙන ගැනීමේ හා උත්සාහ දැරීමේ සංස්කාර එහිදී පිහිටන්නේ නැහැ. තමාගේ ලාභය ලද පසු මෙම දැනුම අවසන් වී යනවා.

**ගීතය:** රාත්‍රියේ සංචාරය කරන්නාණනි, වෙහෙසට පත් නොවන්න. අරුණැල්ල වැඩි ඈතක නොවෙයි.

ඕම් ශාන්ති. ශිව බාබා දැන් මෙහිදි ඔබවම මුණ ගැසී ඔබටම කතා කරයි. ගීතාවේ සඳහන් කර තිබෙන්නේ ක්‍රිෂ්ණා දෙවියන් කතා කරයි කියලයි. කොහොමනමුත්, ක්‍රිෂ්ණාට කිසිම විටෙක එම නමින්ම හා එම රූපයෙන්ම ඔබ ඉදිරියේ පෙනී සිටීමේ හැකියාවක් නැහැ. ඔබ අමතා කතා කරන්නේ අශරීරික දෙවියනුයි. ඔහු ඔබ වෙනුවෙන්ම දැන් මෙහි ඉඳන් කතා කරයි. 'ක්‍රිෂ්ණා දෙවියන් කතා කරයි' කියා කිව්වොත් ඔවුන් එය කියන්නේ භෞතික කෙනෙක් ගැන කියනවා වගේයි. වේද ග්‍රන්ථ හා ආගමික ග්‍රන්ථ කියවනා අය කවදාවත් 'දෙවියන් කතා කරයි' කියා කියන්නේ නැත. මන්ද, එම සන්‍යාසීන්, මහාරාතීන් හා පූජකවරුන් සෑම කෙනෙක්ම භෞතික අය වන නිසායි. පියා කියනවා ඔහෝ ආධ්‍යාත්මික සංචාරකවරුනි. ආධ්‍යාත්මික පියා අනිවාර්යයෙන්ම ජීව සත්තාවන් හට මෙසේ කියාවි දරුවනි, වෙහෙසට පත් නොවන්න. ඇතැම් අය වන්දනා ගමනක් යන අතරේදී වෙහෙසට පත් වීම නිසා ආපසු යන්න යනවා. ඒවා භෞතික වන්දනා ගමනුයි. එවන් භෞතික වන්දනා ගමන් වල යන විට ඔවුන් නොයෙකුත් ආකාරයේ දේවාල, පල්ලි, පන්සල් වලට යනවා. භක්ති මාර්ගයේ සෑම භෞතික පිළිමයක්ම තබා ඇති ශිව දේවාල වලට ඇතැම් අය යනවා. මෙම උත්තරීතර ශක්තිය වන උත්තරීතර පියා වන උත්තරීතර ජීවය ඔබට මෙම දැනුම දී ඔහෝ දරුවනි, ඔබගේ යෝගාව මා වෙතටම සම්බන්ධ කරවා ගන්න කියා ජීව අමතා කියනවා. මිනිස්සු වන්දනා ගමන් යන විට ග්‍රන්ථ වල එන කතාන්දර, ගාථා කියා දෙන බ්‍රහමින් පූජකවරුන් එම දේවාල වල සිටිනවා. කොහොමනමුත්, ඔබගේ මෙම කතාව සැබෑ නාරායන් බවට පත් වීමේ එකම එක කතාන්දරයයි. සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන් කෙනෙක් බවට පත් වීමේ කතාන්දරයයි. පළමුවෙන්ම මිහිරි නිවහන වෙත ගොස් පසුව විශ්නුගේ දේශය වෙත තමන් පැමිණෙනවාය යන අවබෝධය ඔබට තිබෙනවා. දැන් මේ මොහොත වන විට ඔබ සිටින්නේ බ්‍රහ්මාගේ දේශයේයි. මෙය හඳුන්වන්නේ ඔබගේ දෙමාපියන්ගේ නිවහන කියලයි. ඔබට කිසිම ආභරණයක් ආදී දේවල් නැහැ. මන්ද, ඔබ සිටින්නේ ඔබගේ දෙමාපියන්ගේ ගෙදරයි. තමන්ගේ නැදෑයින්ගේ ගෙදරින් අසීමිත වූ සතුටක් තමන්ට ලැබෙන්න යනවා කියා ඔබට තේරෙනවා. මෙහි සිටිනා කලි යුගයේ නැදෑයින්ගේ ගෙදර ඇත්තේ අසීමිත වූ දුකකි. සතුටේ දේශය වෙත ඔබ දැන් යා යුතුයි. ඔබව මෙහෙන් මාරු කර යැවිය යුතුයි. පියා ඔබ සෑම කෙනෙක්වම තමාගේ ඇස් මත තබාගෙන නිවස වෙත ගෙන යාවි. ක්‍රිෂ්ණාගේ පියා ක්‍රිෂ්ණාව මල්ලක දමාගෙන ගඟකින් එතෙර කරනා ආකාරය පෙන්වා තිබෙනවා. මෙහි සිටිනා අසීමිත පියා ඔබව ඔබගේ නැදෑයින්ගේ නිවස වෙත ගෙන යනවා. පළමුවෙන්ම ඔහු ඔබව ඔබගේ අශරීරික නිවස වෙත ගෙන ගොස් පසුව නැදෑයින්ගේ නිවස වෙත ගෙන යනු ඇත. සාමයේ දේශය වෙතට ගිය පසු ඔබට මෙම නැදෑයින්ගේ ගෙවල් ගැන හා දෙමාපියන්ගේ ගෙවල් ගැන වූ සෑම දෙයක්ම අමතක වී යනු ඇත. එය ඔබගේ අශරීරික වූ දෙමාපියන්ගේ නිවහනයි. එහිදී ඔබට මෙම දැනුම අමතක වේවි. දැනුමේ සංස්කාර අතුරුදන් වී ප්‍රතිලාභයේ සංස්කාර පමණක් ඉතිරිවනු ඇත. එවිට දරුවන් වන ඔබලා තුළ ඇත්තේ මෙම ප්‍රතිලාභයේ සංස්කාර පමණයි. එම ප්‍රතිලාභයට අනුව ඔබ සතුටින් පිරි දිවියකට උපත ලබනු ඇත. සතුටේ දේශය වෙතට ඔබ යා යුතුයි. එය සාමයේ දේශයයි මෙම දැනුම එහි ඇත්තේ නැහැ. එක් වතාවක් තමාගේ ලාභය දිනා

ගැනීමෙන් අනතුරුව මෙම දැනුම අවසන් වී යනු ඇත. එම ප්‍රති ලාභයේ කාලයේදී සිදු වුණු සෑම ක්‍රියාවක්ම ඒ ආකාරයෙන්ම නැවතත් සිදු වනු ඇත. ඔබගේ සංස්කාර ප්‍රතිලාභයේ සංස්කාර බවට පත් වනු ඇත. ඔබට දැන් ඇත්තේ උත්සාහ දැරීමේ සංස්කාරයි. උත්සාහයේ හා ප්‍රතිලාභයේ යන දෙකේම සංස්කාර මෙහිදී ඇත්තේ නැහැ. මෙම දැනුම එහිදී නැහැ. මෙය ඔබගේ ආධ්‍යාත්මික වන්දනා ගමන වන අතර පියා ඔබගේ ප්‍රධාන මඟ පෙන්වන්නායි. ඇත්ත වශයෙන්ම බලනවා නම් ඔබත් ආධ්‍යාත්මික මඟ පෙන්වන්නන් බවට පත් වී සෑම කෙනෙක්වම ඔබ සමඟ ගෙන යනවා. අනෙකුත් මඟ පෙන්වන්නන් භෞතිකයි. නමුත් ඔබලා ආධ්‍යාත්මිකයි. මිනිස්සු මහත් වූ උද්දාමයකින් අමරනාථ වෙතට යනවා. ලොකු ලොකු කණ්ඩායම් විශේෂයෙන්ම අමරනාථ වලට යන්නේ මෙම උද්දාමය නිසායි. බාබා නොයෙකුත් ආකාරයේ සංගීත භාණ්ඩ ආදිය රැගෙන සිටිනා සන්‍යාසීන් හා පූජකවරුන්ව දැක තිබෙනවා. එවන් වන්දනා ගමන් යන විට ලෙඩරෝග හැදෙයි කියා ඔවුන් වෛද්‍යවරයෙකුත් අරගෙන යනවා. ඔබගේ වන්දනාව ඉතාමත් පහසුයි. පියා කියනවා ඔබගේ වන්දනාව ස්මරණ වන්දනාවයි. ප්‍රධානම දෙය නම් ස්මරණයයි. ඔබගේ සතුටේ රසදිය කඳ ඔබ තුළ ඇති ස්මරණයේ තරමට ඉහළ නඟිනු ඇත. ඔබ අන් අයවත් මෙම වන්දනා ගමනේ එක්ක ගෙන යා යුතුයි. මෙම වන්දනාව සිදුවන්නේ එක් වතාවක් පමණයි. භෞතික වන්දනා ගමන් ඇරඹුණේ භක්ති මාර්ගයේදියි. නමුත් ඒවා එම ආරම්භයේදීම ඇරඹුණේ නැහැ. ඒවා ටිකෙන් ටික නිර්මාණය වුණා. පළමුවෙන්ම ශිවා වෙනුවෙන් වූ දේවාල ඉදි වෙනවා. පළමුවෙන්ම ඔවුන් තම තමන්ගේ ගෙවල් වල සෝමනාථ දේවාලයක් සාදා ගන්නවා. එවිට කොහේවත් පිට තැනකට යාමේ අවශ්‍යතාවයක් ඇතිවන්නේ නැහැ. අනෙකුත් සෑම දේවාලයක්ම ආදිය සෑදුණේ පසු කාලයේදීයි. තඹ යුගයේදී අළුත් ග්‍රන්ථ, අළුත් පින්තූර, අළුත් දේවාල ආදිය හෙමින් හෙමින් ඉදිවෙන නිසා ඒ සඳහා දැඩි වෙහෙසක් දරන්න සිදු වුණා. ග්‍රන්ථ ඉගෙන ගැනීමට පිරිසකුත් සිටිය යුතු වන නිසා ඒකට ටික කාලයක් ගත වෙනවා. එම නිකාය වැඩි වන විට තමයි ආගමික ග්‍රන්ථයක් නිර්මාණය කළ යුතුයි යන සිතිවිල්ල මතු වන්නේ. මෙතරම් වන්දනා ස්ථාන රාශියක්, දේවාල, පින්තූර රාශියක් සෑදීමට සෑහෙන කාලයක් ගත වෙනවා. භක්ති මාර්ගය ඇරඹෙන්නේ තඹ යුගයෙන් කියා කිව්වත් ඒකට ටික කාලයක් ගත වෙනවා. කලාවන් එන්න එන්නම පහළ බසිනවා. මුලදී භක්තිය ඉතාමත් පිරිසිඳුයි. පසුව එය අපිරිසිඳු වෙන්න පටන් ගත්තා. මේ සෑම දෙයක්ම ඉතාම හොඳින් පින්තූර වල සාක්ෂි ඇතිව පෙන්නුම් කර තිබෙනවා. පැහැදිලි කිරීම් කරනා අය එවන් විවිධ කරුණු පැහැදිලි කිරීම සඳහා කුමන විදියේ පින්තූර නිර්මාණය කළ යුතුද කියා කල්පනා කළ යුතුයි. මේ අදහස් සෑම කෙනෙකුගේම සිහියේ නැහැ. සෑම දෙයක්ම අනුපිළිවෙලයි. ඇතැම් අයට මෙවන් දේ ගැන කිසිසේත්ම සිහිය යොදවන්න බැහැ. ඉතින් එමනිසා ඔවුන්ට ලැබෙන්නේ එවන් වූ ආකාරයේ තත්ත්වයක්. ඔවුන් කුමන ආකාරයේ තත්ත්වයකට පත් වේවිද යන්න පැහැදිලියි. තවත් ඉදිරියට යන විට ඔබට තවත් දේවල් අවබෝධ කර ගත හැකි වේවි. යුද්ධය ඇරඹුණු විට සෑම දෙයක්ම හැබහින්ම දැක ගැනීමට ඔබට හැකි වේවි. එවිට ඔබට පසුතැවිලි වීමට සිදු වේවි. එවිට කිසිම දෙයක් ඉගෙන ගන්න බැරි වේවි. යුධමය වාතාවරණයක් මත ඇත්තේ වේදනාවෙන් කෑ ගැසීමය ඔබට ඒවා අහගෙන ඉන්න බැරි වේවි. මොනවා සිදු වේවිද කියා කවුද දන්නේ? රට බෙදන වේලාවේ සිදු වුණේ කුමක්ද කියා ඔබ සෑම කෙනෙක්ම දැක්කා. විනාශය වන මොහොත ඉතාමත් දරුණුයි. එකිනෙකා කෙතරම් දුරකට ඉගෙනගෙන තිබෙනවාද කියා ඔබට දර්ශන වලින් දැක ගත හැකි වේවි. පසුතැවිලි වීම් රාශියක් ඇති වේවි. ඔබට නොයෙකුත් දර්ශන පෙනෙන්න පටන් ගනීවි. ඔබ ඉගෙන ගැනීම නතර කළ නිසා තමයි ඔබ මෙවන් තත්ත්වයකට පත් වුණේ. පළමුවෙන්ම දර්ශනයක් දෙන්නේ නැතිව කොහොමද ධර්මරාජ් ඔබට දඬුවම් දෙන්නේ? ඔහු සෑම දෙයක්ම ගැනම දර්ශන දේවි. ඒ කාලය වන විට ඔබට කිසිම දෙයක් කර කියා ගන්න බැරි වේවි. 'අනේ මගේ අවාසනාව' කියා තමයි ඔබට කියන්න සිදුවන්නේ. උත්සාහ දැරීමේ කාලය දැන් අවසන් වී තිබේවි. එමනිසා, පියා කියනවා ඇයි දැන් උත්සාහ දරන්නේ නැත්තේ? පියාගේ හදවත නම් වූ අසුන ඔබට හිමිවන්නේ සේවය මඟිනි. පියා කියාවි මේ දරුවා හොඳ සේවයක් කරනවා. හමුදාවට අයත් පුද්ගලයෙක් මිය ගියොත් ඔහුගේ නෑදෑ හිත මිතුරන්ටත් තෑගි ලැබෙනවා. මෙහිදී ඔබට තෑගි දෙන්නේ අසීමිත පියායි. ඔබ ඔබගේ අනාගත උපත් 21 වෙනුවෙන් පියාගෙන් උරුමය දිනා ගන්නවා. ඔබ සෑම කෙනෙක්ම තම තමන්ගේ අත තම තමන්ගේ හදවතේ තබා, තමන් කෙතරම් දුරට දැනුම ඉගෙන ගන්නවාද කියා ඇසිය යුතුයි. දැනුම උකහා ගන්න බැරි නම්, එය ඔබගේ වාසනාවේ නැති දෙයක් වශයෙන් තමයි සලකන්නේ. ඔබගේ කර්ම එතරම් හොඳ නැති බව කියාවි. බොහෝ නරක ක්‍රියා කර ඇති අයට මෙම දැනුමෙන් බිඳක්වත් ලබා ගන්න බැහැ. පියා පැහැදිලි කරනවා සුමිහිරි දරුවනි, මෙම ආධ්‍යාත්මික වන්දනා ගමන යන විට ඔබ ඔබගේ මිතුරන්වත් එහි රැගෙන යා යුතුයි. මෙම වන්දනා ගමන ගැන සෑම කෙනෙක්ටම පැවසීම ඔබගේ රාජකාරියයි. අපගේ මෙම වන්දනාව ආධ්‍යාත්මික වුවක් නමුත් අනිත් වන්දනාවන් භෞතික දේවල් වන බව ඔවුන්ට

කියන්න. රන්ගුන් ළඟ මායාකාර විලක් තිබෙනවා දැක්කලු. එහි දිය නැමෙන් සුරංගනාවියන් බවට පත්විය හැකියි කියා කිව්වා. කොහොමනමුත්, කිසිම කෙනෙක් සුරංගනාවියක් බවට පත් වුණේ නැහැ. පාරාදීසයේ අධිරාජ්‍යවරුන් බවට පත් වීමට අවශ්‍ය නම්, දැනුමෙන් ස්නානය කිරීමයි අවශ්‍ය වන්නේ. දැනුමේ හා යෝගා වල බලයෙන් පාරාදීසය වෙත ගොස් ඒම ඔබට සාමාන්‍ය දෙයක්. ඇත්තෙන්ම කියනවා නම්, ධ්‍යාන වලට නිතර නිතර යාම පුරුද්දක් බවට පත්වෙන නිසා එය නතර කරලයි තිබෙන්නේ. එමනිසා, මෙය තමයි මන්සරෝවාර් දැනුම වන්නේ. උත්තරීතර පියා වන උත්තරීතර ජීවය මෙහි පැමිණ මෙම මානව ශරීරය මඟින් ඔබට මෙම දැනුම ලබා දෙනවා. මෙන්න මේ නිසා තමයි එය මන්සරෝවාර් යනුවෙනුත් හඳුන්වන්නේ. 'මන්සරෝවාර්' යන වචනය පැමිණෙන්නේ සාගරයෙනි දැනුම් සාගරයේ ස්නානය කිරීම ඉතාමත් හොඳ දෙයක්. පාරාදීසයේ සිටිනා බිරිඳක් හඳුන්වන්නේ අධිරාජිණියක් වශයෙනි. පියා කියනවා ඔබලාත් පාරාදීසයේ පාලකවරුන් බවට පත් විය යුතුයි. දරුවන් වෙත සෙනෙහසක් තිබෙනවා. සෑම කෙනෙක් වෙතම කරුණාව දක්වනවා. පූජකවරුන් සම්බන්ධයෙනුත් කරුණාවක් ඇති වෙනවා. දෙවියන් පූජකවරුන්වත් ඔසවා තැබුවා කියා ගීතාවේ සඳහන් කර තිබෙනවා. එවන් එසවීමක් සිදුවන්නේ දැනුම හා යෝගා මඟිනි. අන් අයට පැහැදිලි කර දීමේදී දරුවන් වන ඔබලා ඉතාමත් හොඳ අවධානයකින් යුතුව, ක්‍රියාශීලීව එය කළ යුතුයි. ඔවුන්ට කියන්න ඔබ දන්නා සෑම දෙයක්ම මෝරු වගෙයි. ඔබ දන්නේ නැහැ බටර් දෙන්නේ කවුද කියා. පියා සෑම දෙයක්ම ඉතා පැහැදිලිව ඔබට කියා දෙනවා. නමුත් ඒ සෑම දෙයක්ම රඳා පවතින්නේ ඒවායින් කෙතරම් ප්‍රමාණයක් ඔබගේ සිහියේ තිබෙනවාද යන්න මතයි. පියාව හඳුනා ගැනීමෙන් මිනිසුන් දියමන්ති බවට පත් වෙනවා. ඔහු ගැන නොදැන සිටීමෙන්, මිනිස්සු සම්පූර්ණයෙන්ම ගලක් බවට පත් වෙනවා. පියාව දැන ගැනීමෙන් ඔවුන් පිරිසිදු වෙනවා. අපිරිසිදු ලෝකය තුළ කිසිම පිරිසිදු කෙනෙක් නැහැ. මහාරාතීන් වශයෙන් සිටිනා දරුවන්ට මේවා හොඳින් අවබෝධ කර දිය හැකියි. බ්‍රහ්ම කුමාරයින් හා කුමාරියන් රැසක් සිටිනවා. ප්‍රජාපිතා බ්‍රහ්මා යන නම ඉතාමත් ප්‍රසිද්ධයි. ඔබලා එම ප්‍රජාපිතා බ්‍රහ්මාගේ කටින් උපන් දරුවන්ය. බ්‍රහ්මාව පෙන්වා ඇත්තේ අත් 100ක් නැතිනම් 1000ක් ඇති අයෙක් වශයෙනි. එමෙන්ම බ්‍රහ්මාට එතරම් විශාල අත් රාශියක් තිබිය නොහැකි බවත් පෙන්වා තිබෙනවා. බ්‍රහ්මාට දරුවන් රාශියක් සිටිනවා. බ්‍රහ්මා කාගේ දරුවාද? බ්‍රහ්මා ශිව බාබාගේ දරුවායි. මොහුගේ පියා වෙන්නේ වෙන කවුද? මනුෂ්‍යයෙක් වෙන්න බැහැ. බ්‍රහ්මා, විශ්නු හා ශන්කර් සූක්ෂම කලාපයේ වැසියන් වශයෙන් පෙන්වා තිබෙනවා ඔවුන්ට මෙහි පැමිණෙන්න බැහැ. ප්‍රජාවගේ පියා වන බ්‍රහ්මා අනිවාර්යෙන්ම මෙහි ඉඳීවි. ඔහුට සූක්ෂම කලාපයේ ඉඳගෙන මිනිස්සු හදන්න බැහැ. එමනිසා, උත්තරීතර පියා වන උත්තරීතර ජීවය මෙහි පැමිණ බ්‍රහ්මාගේ මුඛයෙන් මෙම ශිව ශක්ති හමුදාව නිර්මාණය කරනවා. පළමුවෙන්ම තමන් බ්‍රහ්මාගේ කටින් උපන් දරුවන් බව හඳුන්වා දිය යුතුයි. ඔවුනුත් බ්‍රහ්මාගේ දරුවන් බව කියන්න. ප්‍රජාපිතා බ්‍රහ්මා සැමගේම පියායි. පසුව ඔහුගෙන් අනෙකුත් පරම්පරා මතු වන අතර නම් වෙනස් වෙන්න පටන් ගන්නවා. ඔබලා දැන් බ්‍රහමින්වරුනුයි. ප්‍රජාපිතා බ්‍රහ්මාට දරුවන් කී දෙනෙක් සිටිනවාද කියා ඔබට බැලිය හැකියි. දරුවන්ට අනිවාර්යෙන්ම උරුමයක් හිමි විය යුතුයි. බ්‍රහ්මාට කිසිම බුදලයක් නැහැ. සෑම බුදලයකම අයිතිය ඇත්තේ ශිව බාබාටයි. බ්‍රහ්මා ශිවාගේ දරුවායි. ඔබට අසීමිත පියාගෙන් ඔබගේ උරුමය හිමි වෙනවා. ශිව බාබා මෙහි ඉඳගෙන බ්‍රහ්මා මාර්ගයෙන් ඔබට උගන්වනවා. ඔබට ඔබගේ සීයාගෙන් උරුමය හිමි වෙනවා. බාබා ඉතාමත් හොඳින් ඔබට සියල්ල පැහැදිලි කර කියා දුන්නත් ඔබ යෝගා කරන්නේ නැහැ. ඔබ නීතියට අනුව වැඩ කරන්නේ නැතිනම් ඒකට පියා මොනවා කරන්නද? පියා කියනවා බාබාගෙන් ඇහුවොත් ඔබගේ වර්තමාන තත්ත්වය මත කුමන ආකාරයේ තත්ත්වයක් ඔබට අනාගතයේදී හිමි වේවිද කියා ඔහුට කිව හැකියි. ඔබ කෙතරම් දුරක සේවයක් කරනවාද, කෙතරම් දුරට ශ්‍රීමත් අනුගමනය කරනවාද යන්න ඔබගේ හදවතම සාක්ෂි දරාවි. ශ්‍රීමත් කියනවා මන්මනාභව්! පියා ගැනත් උරුමය ගැනත් වූ හැඳින්වීම දිගින් දිගටම සෑම කෙනෙක්ටම ලබා දෙන්න. බෙර වාදනය කරන්න. ඔබ දැන් ආණ්ඩුවටත් මේවා පැහැදිලි කළ යුතුයි කියා බාබා සෑම විටම ඔබට පෙන්වා දෙනවා. මන්ද, එවිට භාරතයේ තත්ත්වය ඇත්තටම ඇද වැටී ඇති බව ඔවුනුත් අවබෝධ කර ගනීවි. උත්තරීතර පියා වන උත්තරීතර ජීවය සමඟ කිසිම යෝගාවක් නැහැ. ඔහු සමඟ යෝගා කරනා විට, ඔබට මායා ජය ගත හැකියි. එමඟින් ලෝක පාලකවරයෙක් බවට පත් විය හැකියි. නිවසේ ජීවත් වන ගමන් ඔබ මායාව ජය ගන්නවා. පියා අපගේ උදව්කරුවායි. ඔබට බොහෝ දේ පහදා දී තිබෙනවා. නමුත් එබ ඒවා උකහා ගත යුතුයි. බාබා පැහැදිලි කර කියා දී තිබෙනවා ධනය දානය කළාට අඩු වෙන්නේ නැහැ. සේවය කළ විට පමණයි බාබාගේ හදවත නමැති සිහසුන වෙත අසුන් ගත හැකි වන්නේ. නැතිනම්, එය අපහසු දෙයක් වෙනවා. බාබා ඔබට ආදරේ නැහැයි කියා ඉන් අදහස් වන්නේ නැහැ. බාබා සේවයට කැමති දරුවන්ට ආදරෙයි. සෑම කෙනෙක්වම මන්මනාභව් යන වන්දනාවේ ගෙන යාමට ඔබ උත්සාහ දැරිය යුතුයි! මෙය ආධ්‍යාත්මික වන්දනාවකි. මා සිහිපත් කරන්න,

ඔබ මා වෙත පැමිණෙනු ඇත. ශිවාගේ දේශයට පැමිණීමෙන් අනතුරුව, ඔබ විශ්නුගේ දේශය වෙත යනු ඇත. මේ දේවල් දන්නේ දරුවන් වන ඔබ පමණයි. අන් අය කොපමණ හොඳින් ඉගෙන ගත්තත්, ඒ කිසිම කෙනෙක්ට 'මන්මනාභව' යන්න තේරෙන්නේ නැහැ. පියා ඔබට මෙම ශ්‍රේෂ්ඨ මන්ත්‍රය දෙනවා මා සිහි කරන්න එවිට ඔබ පාප ජය ගත්තෙක් බවට පත්වනු ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දැනුම ස්නානය කරන්න. සෙනෙහසින් අන් අයට සේවය කර බාබාගේ හදවත නමැති සිහසුන දිනා ගන්න. උත්සාහ දැරීමේදී කිසිම විටෙක දැන් නොසැලකිලිමත් වන්න එපා.
2. බාබාගේ ඇඟි බැම මත ඉඳගෙන දැන් ඔබ මෙම කලි යුගයේ දුකින් පිරි දේශයෙන් එහා ඇති සතුටේ යුගය වෙතට යා යුතුයි. එමනිසා, තමා සතු සෑම දෙයක්ම මාරු කර හරින්න.

**වරදානය:** ඔබ සදා සතුටට පත් වී, ඔබගේ දිව්‍යමය ගුණදම් මල් උයන් ජීවිතයේ සතුට අත්විඳිත්වා. නිරන්තර සතුටේ ස්ථිතියක සිටීම යනු පිරිපුන් සහ පරිසමාප්ත වීමයි. පෙර ඔබගේ ජීවිතය කටු කැලෑවක තිබුණු අතර ඔබ දැන් මල්වල සතුට වෙතට පැමිණ ඇත. දිව්‍යමය ගුණදම් වල සතුට නිරන්තරයෙන් ඔබගේ ජීවිත උයනේ තිබේ, එබැවින් ඔබ සමග සම්බන්ධ වන සියලු දෙනාටම දිව්‍යමය ගුණදම් වල මල් සුගන්ධය අඛණ්ඩව ලැබෙන අතර මෙම සතුට දැක, ඔවුන් සතුටට පත් වෙයි. ඔවුන් බලය අත්විඳියි. මෙම සතුට අන් අයව බලගන්වා ඔවුන්ට සතුට ලබා දෙයි, ඔබ සදා සතුටින් සිටින බව පවසන්නේ මේ නිසයි.

**පාඨය:** මාස්ටර් සර්ව බලධාරියෙක් යනු, ඒවාට බිය වනවා වෙනුවට මායාගේ බුබුළු සමග ක්‍රීඩා කරන කෙනෙකි.

***** ඕම ශාන්ති *****